# ලෝකය නිර්මාණය කිරීම

සියලු සංස්කාරයෝ අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයි දේශනා කළ බුදුහාමුදුරුවෝ ඒ ශූන්‍ය යැයි ද වදාළහ. ඒ බව සඳහන් සූත්‍ර ගැන අභාවප්‍රාප්ත මහාචාර්ය ඩබ් ඇස් කරුණාරත්න මහතා ලියා පළකර ඇති ලිපිවල ද සඳහන් වෙයි. මේ ඇතැම් ලිපි එතුමාගේ අභාවයෙන් පසු පොතක් ලෙස මුද්‍රණය කෙරී ඇත. ක්‍රිස්තු වර්ෂ හෙවත් බටහිරයන් සම්මත කර සෙසු ලෝකයා මත පටවා ඇති වර්ෂවලින් දෙවැනි සියවසේ වැඩ විසූ නාගර්ජුන කාමුදුරුවෝ සංකල්පයක් නොවූ ශූන්‍ය යන්න ශූන්‍යතාව ලෙස වර්ධනය කළහ. ඒ සංකල්පයක් නොවූ අනිත්‍ය අනිත්‍යතාව යනුවෙන් සංකල්පයක් ලෙස වර්ධනය කිරීම සමග සැසඳිය හැකි ය. එහෙත් වාසනාවකට කිසිවකු අනිත්‍යතාව යනුවෙන් ගැඹුරු සංකල්පයක් නිර්මාණයකිරීමට උත්සාහ දරා නැත.

ඇතැමකු අනිත්‍ය, අනාත්ම ආදිය සංකල්ප ලෙස සලකා ඇති බව පෙනෙයි. එහෙත් ඔවුහු සංකල්ප වර්ධනයක යෙදුණු පුද්ගලයෝ නො වූහ. ඔවුන්ට එසේ කිරීමට තරම් හැකියාවක් ද නැත. අනිත්‍ය යන්න යථාර්ථය ලෙස දැකීමට එක් අයකු දෙදෙනකු උත්සාහ ගෙන ඇතත් ඒ සාර්ථක වී නැත. තවත් අයකුට අනුව ආත්මයක් නැත්නම් අනාත්මයක් ද නැත. ඇතැමකුට අනුව ආත්මයක් නැතැයි කීම ද වැරදි ය. එයට හේතුව ආත්මයක් නැතැයි කීමට පළමුව ආත්මයක් ඇතැයි යනුවෙන් පිළිගත යුතු බැවිනි. ආත්මයක් ඇතැයි නොකියා ආත්මයක් නැතැයි කිව නොහැකි බැවින් අනාත්මයක් ගැන කතාකරන්නවුන් ද ආත්මවාදීන් වන්නේ යැයි ඔහු කියයි.

හාවුන්ට අං නැතැයි අප කියන්නේ වෙනත් ඇතැම් සතුන්ට අං ඇති නිසා ය. ඇතැම් සතුන්ගේ ඇති අඟ වැනි අවයවයක් හාවුන්ට නැති බැවින් අප හාවුන්ට අං නැතැයි කියන විට අඟ නම් අවයවයක් ඇති බව දැනගෙන අවසාන ය. වෙනත් ආකාරයකට කියන්නේ නම් හාවුන්ට අං නැතැයි කීමට පෙර කාට වුව අං ඇති බව අපි පිළිගනිමු. එබැවින් අං නැතැයි කිවහැක්කේ අං ඇති බව පිළිගන්නා අංවාදියකුට යැයි අවශ්‍ය නම් අපට කිව හැකි ය. සාමාන්‍යයෙන් සතුන්ට අං දෙකක් ඇත. එක් අඟක් පමණක් ඇති සතුන් ගැන ඇතැම් සංස්කෘතීන්හි සාහිත්‍යයෙහි සඳහන් වෙයි.

එහෙත් මා දන්නා තරමින් අං පහක් ඇති සත්තු නැත්තාහ. ජීවවිද්‍යාඥයන්ට එවැනි සතුන් ගැන අවබෝධයක් ඇත්දැයි මම නො දනිමි. ඒ කෙසේ වෙතත් අං පහක් ඇති සතකු අපට සිතෙන් මවාගත හැකි ය. සිතෙන් මවාගත් පමණින් එවැනි සතුන් ඇති බවක් නො කියැවෙයි. දැන් මා අං පහක් ඇති සතුන් නැතැයි කිවහොත් කුමක් වේ ද? අං පහක් ඇති සතුන් නැතැයි කීමට නම් අං පහක් ඇති සතුන් ඇති බව පිළිගත යුතු ද? අං පහක් ඇති සතුන් නැති බව පිළිගැනීමට පළමුව අං පහක් ඇති සතුන් ඇති බව පිළිගත යුතු ද? අං පහක් ඇති සතුන් නැතැයි කීමෙන් මා පංච අංවාදියකු බවට පත්වන්නේ ද? යමක් ඇති බව පිළිගැනීම, යමක් නැති බව පිළිගැනීම, යමක් නැති බව පිළිගැනීම, යමක් නැති බව නොපිළිගැනීම ආදිය අතර ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යාය යොදා ගෙන වුව ද වෙනසක් දැකිය නොහැකි ද? යමක් ඇති බව නොපිළිගැනීම හා යමක් නැති බව පිළිගැනීම යනු දෙකම එකක් ද?

මේ කරුණු පිළිබඳ වැඩිදුරටත් කතාකිරීමට මට අවශ්‍ය නො වේ. මා මේ ප්‍රශ්න මතුකරන්නේ ඇතැමුන් එවැනි ගැඹුරකටවත් නොගොස් පඬිවීම සඳහා බොරු කතා කියා එතරම් දෙයක් සිතීමට නිවාඩුවක් පාඩුවක් නැති ජනතාව නොමග යවන බව පෙන්වීම සඳහා ය. අප මෙහි දී යොදාගත්තේ ද්විකෝටික න්‍යාය (ලොජික්) පමණ ය. චතුස්කෝටිකය යොදාගත හොත් මෙය තවත් සංකීර්ණ වීම නොවැළැක්විය හැකි ය.

ඉහත සඳහන් සාකච්ඡාව කෙරුණේ සංකල්පීය ලෝකයක ය. අනිත්‍ය දුක්ඛ අනාත්ම ශූන්‍ය සංකල්ප නොවේ නම් ඉහත කී න්‍යාය එකකින්වත් අපට වැඩක් වේ ද? මට වැටහෙන අයුරින් බුද්ධදහමෙහි යෙදෙන අයුරින් අනිත්‍ය යනු සංකල්පයක් නො වේ. අනිත්‍යයන්න දෙයාකාරයකින් යොදාගනු ලැබෙයි. එකක් නිත්‍ය යන්නෙහි විරුද්ධාර්ථය දැක්වීම සඳහා ය. එහි දී නිත්‍ය යන්න මෙන් ම අනිත්‍ය යන්න ද යෙදෙන්නේ සංකල්ප ලෙස ය. එහෙත් බුද්ධදහමෙහි අනිත්‍ය යන්නට විරුද්ධාර්ථ සෙවීම නිශ්ඵල ක්‍රියාවකි. අපට දැනට අවබෝධ නොවන අනිත්‍ය සඳහා අපි වචනයක් යොදා ගන්නෙමු. අනිත්‍ය යන්නෙන් ස්ථිර යමක් නැති බව සිතන්නට අප පුරුදු කෙරෙයි. ඒ අයහපත් දෙයක් නො වේ. එහෙත් අනිත්‍ය යන්නෙන් එවැනි සංකල්පීය වූවක් ප්‍රකාශ වන්නේ නම් අපට අනිත්‍ය ප්‍රත්‍යක්ෂ වී අප නිවන් අවබෝධ කර තිබිය යුතු ය.

© Prof. Nalin De Silva

සංකල්ප හා සංකල්ප නොවන දෑ පිළිබඳ වෙනස තේරුම් ගැනීම නාගර්ජුන හිමියන්ගේ පොත පත ඇසුරෙන් පහසු වන්නේ යැයි සිතමි. අනිත්‍ය දුක්ඛ අනාත්ම ශූන්‍ය වන්නේ අප විසින් නිර්මාණය කෙරෙන (සංස්කරණය කෙරෙන) සංකල්පීය ලෝකය සම්බන්ධයෙනි. සියලු සංස්කාරයෝ අනිත්‍ය, දුක්ඛ අනාත්ම යනුවෙන් කියැවෙන්නේ එබැවිනි. මම යන්න ද සංකල්පයකි. එබැවින් මම යන්න ද සංස්කාරයකි. මම යන්න අනිත්‍ය පමණක් නොව ශූන්‍ය ද වෙයි.

පුටුව, පැන්සල, ගෙදර ආදී සියල්ල අපේ සංස්කාර වෙයි. අපි ඒ සියල්ල සංකල්පීය ව දනිමු. මෙහි දී සංකල්පය යනුවෙන් අදහස් කරන්නේ අදහස, සංකල්පය ආදී සියල්ල ය. සාමාන්‍යයෙන් සංකල්පයකින් බලාපොරොත්තුවන නිරවචන සහිත අචීශිල බවක් එහි දී අවශ්‍ය නො වේ. අපට ඉහත කී අන්දමේ සංකල්පවලින් තොරව ලෝකයක් නැත. ඒ සංකල්ප අපේ නිර්මාණ වෙයි.

සංකල්පයක් වචනයකින් ම දැක්විය යුතු නො වේ. භාෂාවක් නොදත් ළදරුවන්ට පමණක් නොව මිනිසුන් නොවන සතුන්ට ද සංකල්ප වෙයි. චිත්ත රූප ද සංකල්ප වෙයි. බොහෝ ළදරුවන් අතින් සංඥා කරමින් තම සිතැඟි පළකරනු දක්නට හැකි ය. එසේත් නැතහොත් ඔවුහු හැඬීමෙන් සිනහසීමෙන් තම අදහස් ප්‍රකාශ කරති. මේ සංකල්ප එතරම් නිරවුල් නොවනවා විය හැකි ය. සාමාන්‍යයෙන් මේ අවුල් අදහස්වලට අපි සංකල්ප යැයි නො කියමු. එහෙත් ළදරුවන් නොවන බොහෝ දෙනාට ඇත්තේ ද එතරම් නිරවුල් අදහස් නො වේ.

භාෂාවේ එක් අරමුණක් වන්නේ ද නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීම ය. එහෙත් භාෂාව නිසා ම ඇතිවන ප්‍රශ්න අපමණ ය. විට්ගන්ස්ටයින් නම් දාර්ශනිකයාට අනුව දර්ශනයේ ගැටලුවලට මුල භාෂාව ය. ගණිතඥයන් ගණිතය විශේෂ භාෂාවක් ලෙස යොදා ගන්නේ ද සාමාන්‍ය භාෂාවෙන් අදහස් ප්‍රකාශ කිරීමේ දී ඇතිවන ගැටලු ද සැලකිල්ලට ගනිමිනි. ඒ කෙසේ වෙතත් අවුල් වුවත් නැතත් සංකල්පවලින් තොරව අපට ලෝකයක් නැත. දැන් ප්‍රශ්න කිහිපයක් ඇසිය හැකි ය. ඒ අතර සංකල්පවලින් තොර ලෝකයක් නැත් ද යන්න එකකි. සංකල්ප නිර්මාණය කරන්නේ කවු ද (කුමක් ද) යන්න තවත් එකකි. සංකල්පවලින් තොරව අවබෝධ කරගන්නා "යමක්" වේ ද යන්න තුන්වැනි ප්‍රශ්නයකි. මේ ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු දිය යුතු ය. එහෙත් බොහෝ දෙනා දැක්ම තීරුව කියවන්නේ මෙවැනි ප්‍රශ්නවලට දිර්ඝ පිළිතුරු බලාපොරොත්තුවෙන් නොවන බව දනිමි.

සංකල්පවලින් තොර ලෝකයක් ඇත් ද යන්න තේරුමක් නැති ප්‍රශ්නයකි. අපේ ලෝකය සංකල්පවල එකතුවක් වන විට සංකල්පවලින් තොරව යමක් අපට (අප වැනි පෘථග්ජනයන්ට) තිබිය හැකි නො වේ. සංකල්පවලින් තොර ලෝකය යනු ද සංකල්පයකි. එය ද අවසාන වශයෙන් ගත්කල අපේ ලෝකයේ ම කොටසකි. එහෙත් ඒ කොටසෙහි ඇත්තේ ද එය ම පමණකි. එහි ඇතුළත් වෙනත් කොටස් නැත. එයට හේතුව ඒ පිළිබඳ සංකල්ප අපට නො තිබීම ය. මෙයින් කියැවෙන්නේ කාන්ටියානු දර්ශනයෙහි ඇති දැනගත නොහැකි ලෝකයක් නො වේ ය යන්න පමණක් අවධාරණය කළ යුතු ය.

සංකල්ප නිර්මාණය කරනු ලබන්නේ වෙනත් කවුරුන් විසින් හෝ කිසිවක් මගින් හෝ නොව මනස විසිනි. මනසෙන් තොරව ඇතිවන අදහසක් ගැන කිසිවකුටවත් කිවහැකි නො වේ. ඒ අරුතින් ගත්කල ලෝකය නිර්මාණය කරන්නේ මනසෙනි. එහෙත් ප්‍රශ්නයක් වෙයි. මනස නිර්මාණය කරන්නේ කවු ද? එයට පිළිතුර ද මනස යන්න ය. මනස මනසින් නිර්මාණය වන්නෙ කෙසේ ද යන්න සිංහල බෞද්ධ මනස නමින් පළවී ඇති ලිපියෙහි සහ තවත් ලිපිවල (විශේෂයෙන් ම විදුසර ලිපි) විස්තර කෙරී ඇත. ඒ විස්තර මුද්දරයක ලිවිය හැකි නම් ඒ මුද්දරය අඩ ඇටයක් පණ මොළයක් ඇති මහාචාර්යවරයකු සතු විශාල වර්ගඵලයක් සහිත මුද්දරයක් ම විය යුතු ය. සංකල්පවලින් තොරව අවබෝධ කරගන්නේ නිවන ය. එහෙත් ඒ "යමක්" නො වේ. බුදුදහමේ ඉගැන්වෙන අනිත්‍ය දුක්ඛ අනාත්ම නිවන මේ "එකක්"වත් සංකල්ප නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva